පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා සරල සහ වැදගත් තාක්ෂණික උපදෙස් අපෙන්

තාක්ෂණ හා සන්නිවේදන ඒකකය

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත නව නගරය
හම්බන්තොට

2021.11.01

ISBN 978-624-6034-01-6

01. මිරිස් කොල කොඩවීමේ වෛරසය පාලනය සඳහා මුහුදු පැලෑටි නිස්සාරක යොදාගැනීම.

ලංකාවේ වගාකරන කුලුබඩු බෝග අතුරින් ඉතාමත්ම අත්‍යවශ්‍ය බෝගයක් වශයෙන් මිරිස් සැලකිය හැකිය. මිරිස් වගාව සඳහා ජෛවීය සහ පරිසර බලපෑම් හේතුවෙන් විවිධ හානි සිදුවන අතර එමගින් අස්වැන්න අඩුවනු ඇත. මේ අතුරින් මිරිස් කොල කොඩවීමේ වෛරසය ඉතා වැදගත්වන අතර මෙම රෝගය කුඩිත්තාන් මගින් බෝවීම සිදුවේ. එමනිසා සාමාන්‍යයෙන් රෝගය පාලනය කිරීම සිදුකරනුයේ වාහකයා විනාශකිරීම මගිනි. මේ සඳහා රසායනික ද්‍රව්‍ය යොදාගන්නා අතර එය පරිසර හිතකාමී පාලන ක්‍රමයක් නොවනු ඇත. එමනිසා මිරිස් ශාඛයේ රෝගයට ඔරොත්තුදීමේ හැකියාව හෙවත් ප්‍රතිරෝධීශක්තිය වැඩිකිරීම පිණිස මුහුදු පැලෑටි නිස්සාරක යොදාගත හැකිබව සොයාගෙන ඇත. මෙහිදී මිරිස් පැල ක්ෂේත්‍රයෙහි

සිටුවා දින 15 ට පසුව මුහුදු පැලෑටි සාරය ඉසීමෙන් මිරිස් ශාඛයේ රෝගයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිවනු ඇත. මේ අනුව නිර්දේශිත කෘමිනාශක යෙදීමට අමතරව මුහුදු පැලෑටි සාරයද ඉසීම මිරිස් කොල කොඩවීමේ වෛරසය පාලනය කිරීම සඳහා ඉතා වැදගත් වේ. මුහුදු පැලෑටි සාරය සාදාගන්නා ආකාරය මෙම පොතෙහි අවසානයෙහි දක්වා ඇත.

02. තිරසාර ගොටුකොල වගාවක් සඳහා කාබනික පොහොර වශයෙන් පොස්පොකොම්පෝස්ට් භාවිතා කිරීම.

ජනප්‍රිය පලාවර්ගයක් වන ගොටුකොල වගාකිරීමේදී විශේෂයෙන්ම වානිජ වගාවන්හිදී රසායනික පොහොර භාවිතා කෙරේ. එහෙත් ඒ වෙනුවට පොස්පොකොම්පෝස්ට් වශයෙන් හඳුන්වනු ලබන කාබනික පොහොර වර්ගය ඉතා පහසුවෙන් යොදාගතහැකිය. මෙම පොස්පොකොම්පෝස්ට් සාදා ගැනීම සඳහා රොක්

පොස්පේට් බර අනුව 5% - 10% පමණ සාමාන්‍ය කොම්පෝස්ට් සමග හොඳින් මිශ්‍ර කර ගතයුතු වේ. මෙසේ පොස්පොකොම්පෝස්ට් යෙදීමෙන් ගොටුකොල පඳුරු සංඛ්‍යාව, පත්‍ර විශාලත්වය සහ පත්‍ර සංඛ්‍යාවද රසායනික පොහොර යෙදීමේදී මෙන්ම සිදුවනු ඇත.

03. වී වගාවේ පැරෂුට් තවාන් ආරක්ෂා කිරීම සඳහා වසුන් භාවිතා කිරීම.

වී වගාවේ ජනප්‍රිය තවාන් ක්‍රමයක් වන පැරෂුට් තවාන් වඩාත් මඩ සහිත හැල් කුඹුරු සඳහාත් මී උණෙන් ආරක්ෂාවීම සඳහාත් වැදගත් වේ. මෙම තවාන් සාමාන්‍යයෙන් කුඹුරෙහිම පිහිටුවන බැවින් වී තවාන් තැටිවල ස්ථාපනය කල පසුව සුළඟින් සහ වැසිවලින් ඒවාට හානිවීමට බොහෝ ඉඩකඩ පවතී. එම නිසා සාමාන්‍යයෙන් ගොවිමහතුන් පොල්අතුවලින් ආවරණය කරනු ඇත. එහෙත් පොල්අතු සුලභ නොවන ප්‍රදේශවලදී ඒ සඳහා එම

ප්‍රදේශවලින් ලබාගතහැකි සහ ඉක්මනින් දිරාපත්වන ද්‍රව්‍යයන් යොදාගත හැකිය. මේ සදහා වඩාත්ම සුදුසු වසුන් ද්‍රව්‍යයක් වශයෙන් පත්තර කඩදාසි සහ පිදුරු යොදාගතහැකි අතර වැසි සහිත විශේෂයෙන් මහ කන්නයේදී පොලිතීන් කොල භාවිතා කලහැකිය. මෙවැනි වසුන් යෙදීම මගින් වී වගාවේ පැරෂුට් තවාන් ආරක්ෂා කිරීම සහ ඒවා පරිසර හානිවලින් වලකාගත හැකිය.

04. තිලාපියා මිරිදිය මසුන් සදහා පෝෂ්‍යදායී අඩු වියදම් ආහාරයක් සකසා ගැනීම.

මිරිදිය මසුන්ගේ වර්ධනය සදහා පෝෂ්‍යදායී මෙන්ම තුලිත වූ ආහාරයක් ලබාදීම ඉතා අවශ්‍ය වේ. දැනට වෙළඳපොලෙහි පවත්නා ආහාර ඉතා මිල අධිකවන අතර ලබාගැනීමද තරමක් අපහසුය. එමනිසා වඩාත් පහසුවෙන් සාදාගතහැකි ආහාරයක් පිළිබඳව සලකා බලමු. ඒ සදහා මාලු කඩවලින් ඉවතට ගලායන මාලු රුධිරය රැස්කර

ඒවා වෙළඳපොළෙහි ඇති සාමාන්‍ය ආහාරයට බර අනුව 15% පමණ මිශ්‍රකර ආහාර සලාකයක් සාදාගතයුතුය. මෙම සලාකය ඉතා පෝෂ්‍යදායී වන අතර තිලාපියා පැටවුන්ගේ ඉක්මන් වර්ධනයක් ලඟාකර ගත හැකිවනු ඇත.

05. කොස් ඇට යොදාගනිමින් කිරිටොපි නිපදවා ගැනීම.

කොස් ඇට ඉතා පෝෂ්‍යදායී ශක්තිජනක ආහාරයකි. සාමාන්‍යයෙන් කොස්ඇට ඉතා අවම මට්ටමකින් පරිභෝජනය කෙරෙන අතර රසකැවිලි නිෂ්පාදනයට යොදාගැනීමට මනා හැකියාවක් ඇත. මෙහිදී කොස්ඇට පොත්ත සමගම තම්බා පොත්ත ඉවත්කර පල්පයක් වනසේ සකසා පසුව සාමාන්‍ය කිරිටොපි සෑදීමේදී යොදාගන්නා උකුකිරි හෝ කිරිපිටි මිශ්‍ර කර ගතයුතුය. මෙහිදී පල්පය කොටස් 9 ට කිරිපිටි හෝ උකුකිරි කොටස් 1 වනසේ මිශ්‍රකර සීනි සහ වැනිලා වැනි රසකාරක එක්කර පදමට

සකස්කර කැබලිවලට කපාගන්න. මෙම ටොපි සාමාන්‍ය කාමර උෂ්ණත්වයේ දින 30 පමණ ගුණාත්මය වෙනස් නොවී තබා ගතහැකිය.

06. මිරිස් වගාවේ රෝග පලිබෝධ පාලනය සඳහා නවීකරණය කරණ ලද පංච ගාව්‍යා මිශ්‍රණය යොදාගැනීම.

මිරිස් වගාව සාමාන්‍යයෙන් බහුලවම රෝග පලිබෝධ හානිවලට පාත්‍රවන අතර එමගින් අස්වැන්න අඩුවීමද සිදුවේ. එසේම අවශ්‍ය පෝෂක සැපයීමට රසායනික පොහොර භාවිතයද සාමාන්‍යයෙන් සිදුකෙරේ. මෙවැනි රසායනික පොහොර භාවිතය හේතුවෙන් නිෂ්පාදන වියදම වැඩිවනවා මෙන්ම අනවශ්‍ය ලෙස භාවිතා කිරීමෙන් පරිසරයටද හානි සිදුවිය හැකිය. එබැවින් පෝෂක අවශ්‍යතාවය සපුරා ගැනීමටත් පලිබෝධ පාලනයටත් පංච ගාව්‍යා මිශ්‍රණය යොදාගැනීම වඩාත් සුදුසු වේ. මෙහිදී පොහොර අවශ්‍යතාවයෙන්

75% පමණද පළිබෝධනාශක අවශ්‍යතාවයෙන් 25% පමණද පංච ගාව්‍යා මිශ්‍රණය මගින් සපුරා ගතහැකිය. මෙම මිශ්‍රණය සාදාගන්නා ආකාරය මෙම පොතෙහි අවසානයෙහි දක්වා ඇත. පංච ගාව්‍යා මිශ්‍රණය යෙදීමෙන් අස්වැන්න ඉහලයාමක්ද සිදුවේ. එමනිසා රෝග පලිබෝධ වලින් තොර වැඩි අස්වැන්නක් ලබාගැනීමට පංච ගාව්‍යා මිශ්‍රණය යෙදීමෙන් හැකියාව ලැබේ.

07. මිරිස් තවාන් රෝගවලින් ආරක්ෂා කිරීමට බීජ සිටුවීමට පෙර ක්ලෝරීන් දියරයෙන් බීජ ප්‍රතිකාර කිරීම.

සාමාන්‍යයෙන් මිරිස් බීජ සිටුවීමට පෙර දිලීර නාශක යෙදීම මගින් බීජ ප්‍රතිකාර කිරීමට නිර්දේශකර ඇත. ඒ සඳහා දිලීර නාශක වෙනුවට විෂබීජ නාශකගුණය සහිත සහ එබැවින්ම විෂබීජ නාශකයක් වශයෙන් භාවිතා කරන ක්ලෝරීන් දියරය අඩු වියදමකින් යුතුව භාවිතා කිරීමට

හැකියාව ඇත. මේ සඳහා වෙළඳපොලෙහි ඇති ක්ලෝරීන් (ක්ලෝරොක්ස්) කොටස් 5 ක් වතුර කොටස් 100 ට මිශ්‍රකර සාදාගන්නා ද්‍රාවනයක මිරිස් බීජ විනාඩි 40 පමණ ගිල්වා තබා ඉවතට ගෙන සිටුවීමෙන් දිලීර සහ බැක්ටීරියා ආසාදන වලින් තොරවු නිරෝගී පැල ලබාගත හැකිය.

08. මිරිස් වගාවේ කොළ හැකිලීම සංකීරණ ආවරණයක් මගින් පාලනය කිරීම.

සාමාන්‍යයෙන් මිරිස් වගාවේ විශාල ගැටළුවක් වී ඇත්තේ කොළ හැකිලීම සංකීරණය වශයෙන් හඳුන්වන රෝගී තත්ත්වය වේ. මෙය වාහකයකු මගින් බෝවන අතර කෘෂි රසායනික භාවිතයක් මගින් වාහකයා පාලනය කිරීම දැනට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමය වේ. එහෙත් මෙහිදී එය පරිසර හිතකාමී නොවනවා මෙන්ම නිෂ්පාදන වියදමද අධික වේ. එම නිසා ගස් ආවරණය කිරීම වඩාත් සාර්ථක ක්‍රමය බවට අවබෝධ වී ඇත. මේ සඳහා

කළ යුතු වනුයේ සාමාන්‍යයෙන් පාත්තියක් එනම් දලවශයෙන් මිරිස් ගස් 50 පමණ එක් ආවරණයක් යටතට සිටින සේ ආරක්ෂිත කූඩු හෙවත් ආරක්ෂිත ආවරණ ස්ථාපනය කළයුතුය. මේ සඳහා වාහක කෘමීන්ට ඇතුළු වීමට තරම් නොවන එහෙත් වාතාශ්‍රය ලැබෙන තරමින් සකස් වූ සියුම් සිදුරු සහිත දැල් විශේෂයක් භාවිතා කර මෙම ආවරණය හෙවත් කූඩු සකසාගත හැකිය. මෙහිදී ගස් 50 පමණ ප්‍රමාණයක් වටා වගාවේ පිටතින් කණු සිටුවා අවශ්‍ය ආධාරක ලී සවිකර උසින් කූඩාරමක් ආකාරයට මෙම දැල සකස්කරගත යුතුය. මෙකී දැල් වෙළඳපොලෙන් ලබා ගැනීමේදී කෘමි විකර්ෂක (Non woven Fabric Material) දැල් වශයෙන් ඉල්ලුම් කළ හැකිය.

09. බණ්ඩක්කා වගාවේ වැඩි අස්වැන්නක් සදහා කුකුල් පොහොර සමග පණු දියර යෙදීම.

බණ්ඩක්කා වගාවේ දී සාමාන්‍යයෙන් දින 2-3 කට වරක් නොකඩවා අස්වනු නෙලාගත යුතුව ඇත. මේ සදහා අවශ්‍ය පෝෂක යෙදීම නිරතුරුවම කළ යුතු අතර මේ වන විට ඒ සදහා රසායනික පොහොර යෙදීමට ගොවි මහතුන් පුරුදු වී ඇත. එහෙත් හෙක්ටයාරයක බණ්ඩක්කා වගාවට හොදින් දිරූ කුකුල් පොහොර මෙ.ටො 10 සහ තනුක නොකරන ලද පනු සතිපතා යෙදීමෙන් මල් හට ගැනීමට ගතවන කාලය අඩුවන අතර වැඩි අස්වැන්නක් වැඩි කාලසීමාවක් පුරා ලබාගැනීමට හැකි වනු ඇත. මේ සදහා පනු දියර සාදාගන්නා ආකාරය මෙම පොතෙහි අවසානයේ පැහැදිලිව දක්වා ඇත.

10. ආහාර පිසීමේදී උකුකිරීමේ කාරකයක් වශයෙන් කෙසෙල් පිටි භාවිතා කළ හැකිය.

සාමාන්‍යයෙන් කෙසෙල් ඉතා පෝෂ්‍යදායී ආහාරයක් වන අතර ඉදවා ආහාරයට ගැනීම බහුල වශයෙන් සිදු වුවත් ඒවායින් පිටි නිෂ්පාදනය කර භාවිතයට ගැනීමට පුරුදු වී නොමැත. එහෙත් අමු කෙසෙල් ගෙඩි වලින් නිපදවාගන්නා පිටි විවිධ ආහාර වර්ග නිපදවීමට උදාහරණ වශයෙන්- රොටී, පිට්ටු, මුරුක්කු, බූදි වැනි ආහාර වර්ග නිපදවීමට පාන් පිටි හෝ හාල් පිටි සමග මිශ්‍ර කර යොදාගත හැකිය. එසේම සාමාන්‍යයෙන් හෝටල්වල සහ නිවෙස් වල ආහාර උකු කිරීම සදහා විශේෂයෙන් සුප් වර්ග, හොදි වර්ග සඳහා කෝන් පිටි වෙළදපොළෙන් ගෙන භාවිතා කරයි. ඒ සදහා කෙසෙල් ගෙඩි වලින් ලබාගන්නා පිටි පහසුවෙන් භාවිතා කළ හැකිය. මෙහිදී අමු කෙසෙල් විශේෂයෙන් ඇඹුල් කෙසෙල් පොත්ත ඉවත් කර

සිහින් පෙතිවලට කපා ඒවා සිට්‍රික් අම්ලය හෝ දෙහි බිංදු කීපයක් මිශ්‍ර කල වතුරද දමන්න. විනාඩි 10-15 පමණ තබා ඉවතට ගෙන ඒවා උදුනක් භාවිතා කර හෝ හිරු එළියේ පිරිසිදුවට වියලා ගන්න. හොඳින් වියළුණු පෙති ග්‍රයින්ඩරයක දමා හෝ වංගෙඩියක දමා හොඳින් කොටා හලා පිටි වශයෙන් ලබා ගෙන ආහාර පිසීමේදි ඒවා උකු කිරීමට යොදාගත හැකිය. යොදන ප්‍රමාණය අවශ්‍යය පදම අනුව තීරණය වේ. මෙසේ කෙසෙල් පිටි ගෑම් 100 සදහා රුපියල් 45.00 පමණ වැය වන අතර වෙළදපොළෙන් මිලදී ගන්නා කෝන් පිටි ගෑම් 100 සදහා රුපියල් 80.00 පමණ වැය කිරීමට සිදුවේ. මෙය ගෘහස්ත කර්මාන්තයක් ලෙස යොදා ගැනීමට ඉතාම පහසුය.

11. බණ්ඩක්කා බීජ ප්‍රරෝහණය වැඩි කිරීම සදහා පූර්ව ප්‍රතිකාර කිරීම.

සාමාන්‍යයෙන් බණ්ඩක්කා බීජ ප්‍රරෝහණය වීම 93% - 94% පමණ වන අතර ප්‍රරෝහණය වීම ඒකාකාරීද නොවේ. එම නිසා ජනප්‍රිය හා බහුලව වගා කරන බණ්ඩක්කා බෝගයෙහි ප්‍රරෝහණය ඉක්මන් කිරීම, ඒකාකාරීව සිදුකරලීම සහ වැඩි කිරීම සදහා බීජ ප්‍රතිකාරයක් කිරීම වැදගත් වේ. ඒ සදහා සිටු වීමට පෙර බීජ සුළු වශයෙන් පිටත පැත්ත සීරෙන පරිදි රළු මතුපිටක අතුල්ලා ඉන් පසු පිරිසිදු වතුරේ පැය 5 පමණ පොගවා ගත යුතුය. මෙසේ පූර්ව ප්‍රතිකාර කිරීමෙන් පසුව ක්ෂේත්‍රයේ සිටවු පසු ඉහල ප්‍රරෝහණයක් සහ පැලවන බීජ වලින් දිරිය වැඩි පැළ ලබාගත හැකි වීමත් සිදුවේ.

12. නාගරික කෘෂිකර්මය සඳහා ජපන් ජබර හෝ කෙසෙල් කදන් යොදා නිපදවන වගාමළු යොදාගැනීම.

නාගරික කෘෂිකර්මය සදහා පවතිනුයේ සීමිත ඉඩක් සහ ජලය ඇතුළු අනෙකුත් සම්පත් ප්‍රමාණයකි. මෙහිදී බොහෝවිට තිරස් අවකාශයට වඩා සිරස් අවකාශය භාවිතා වන අතර එහිදී එල්ලන ලද බදුන් , සිරස්ව පවත්වා ගන්නා වගාමළු ආදිය යොදා ගැනේ. මෙහිදී වෙළදපොළෙහි පවත්නා කොහු බත් යොදා සාදාගන්නා ලද වගාමළු යොදා ගත හැකිය. ලංකාවේ බොහෝ ජලාශවල ගැටළුවක්ව පවතිනා ජපන් ජබර ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමද ඉතා වැදගත් සහ පරිසර හිතකාමී ක්‍රමවේදයක් වේ. මේ සදහා ජපන් ජබර පමණක් නොව කෙසෙල් කැන් කපා ඉවත ලන කදන් ද යොදාගත හැකිය. පළමුව ජලාශවල ඇති ජපන් ජබර ගලවා ඉවතට ගෙන තරමක කැබලි වලට කපා හොදින් වියලා ගත

යුතුය. එවිට ඒවා අතින් පොඩි කළ විට කුඩුවන සුළුවේ. මෙසේ කුඩුකිරීම සදහා වියළි ජපන් ජබර කැබලි ගෝනියක් හෝ පොලිසැක් මල්ලක් වැනි යමක් තුළට බහා තැලීමෙන් හෝ පෑගීමෙන් කුඩුකරගත හැකිය. තරමක ප්‍රමාණයේ කැබලි තිබුනද ගැටළුවක් නොවේ. එසේම කෙසෙල් කදන් කුඩාපෙති වලට කපා වියලා කුඩු කරගත හැකිය. මේවා බර අනුව කොටස් 3 ක් ගෙන ඊට කොහුබත් කොටස් 1 මිශ්‍රකර කළුපාට පොලිතින් මළුවලට පුරවා පැළ සිටුවීමට යොදාගත හැකිය. අවශ්‍යනම් මෙම මිශ්‍රනය යොදා ගඩොල් කැට වැනි ඝණකයන් සාදා ගත්විට ඒවා පහසුවෙන් ගබඩා කිරීමට, ප්‍රවාහනයට, එල්ලා තැබීමට හැකිවනු ඇත. තෙතමනය රදා පවත්නා මනා වාතාශ්‍රයක් සහිත මනා මිශ්‍රණයක් බැවින් පැළ වර්දනය හොදින් සිදුවනු ඇත.

13. හීන් බෝවිටියා ප්‍රචාරණය කිරීම.

හීන් බෝවිටියා පෝෂණ ගුණය සහ ඖෂධීය ගුණය සහිත ඌෂණ භාවිත පළතුරකි. මෙය ස්වාභාවිකව වැවෙන ශාකයක් වන අතර වාණිජ මට්ටමින් වගා කිරීම සදහා ගැටළුවක්ව පවතිනුයේ රෝපණ ද්‍රව්‍ය හිගවීමයි. මෙම පැළෑටිය ප්‍රචාරණය කිරීමට අපහසු අතර ඒ සදහා සුදුසු ක්‍රමයක් අත්හදා බලා ඇත. ඒ සදහා මධ්‍යස්ථ වශයෙන් මොරන ලද දඩු කැබලි කපා ඒවායේ කැපුම් මුහුණතෙහි මුල් ඇද්දවීමට භාවිතා කරන හෝර්මෝනයක් වන IAA - ඉන්ඩෝල් ඇසිටික් ඇසිඩ් ස්වල්පයක් තවරා මතුපිට පස් : වැලි : කොම්පෝස්ට් පරිමාව අනුව සමාන ප්‍රමාණවලින් ගෙන මිශ්‍රකර මාධ්‍යය වශයෙන් භාවිතා කර සිටුවීමෙන් හොදින් මුල් ඇදී අළුත් පැළෑටියක් වශයෙන් වර්ධනය කර ගැනීමට හැකියාව ඇත.

14. කරුදු වගා කිරීමේදී බීජ පැළ වගාවක් පවත්වා ගැනීම ක්ලෝන මගින් (දඬු කැබලි වලින්) පවත්වාගන්නා වගාවකට වඩා ලාබදායී වේ.

කුරුදු සිටුවීම බීජ මගින් හා දඬු කැබලි හෙවත් ක්ලෝන මගින් සිදුකළ හැකිය. ක්ලෝන මගින් වගාවක් පවත්වා ගන්නා විට ඒකාකාරීව වර්ධනය වන වගාවක් ලබාගත හැකිය. බීජ මගින් සිටුවන වගාවකදී ඇතිවන අතු ගණන අඩුවන අතර ඒවා ඍජුව සහ කෙලවරදි තරමක් පහළට වක් වී හටගනී. එහෙත් ක්ලෝන වගාවේදී ඇතිවන අතු ගණන වැඩිය. එමෙන්ම සාපේක්ෂ අස්වැන්නද තරමක් වැඩිය. කෙසේ වුවද සාම්ප්‍රදායික ක්‍රමයට පොතු ඉවත් කරගැනිම හෙවත් අස්වැන්න නෙලීමේදී වඩාත් පහසු සහ කාර්යක්ෂම අස්වනු රැස්කිරීමක් සිදුකළ හැකි වනුයේ බීජ මගින් පවත්වා ගන්නා වගාවන්ගෙනි. එමනිසා තරමක් අස්වැන්න අඩුවුවද අස්වනු නෑලීමේ

කාර්යක්ෂමතාව සලකා බලන විට බීජ මගින් වගාවක් පවත්වා ගැනීම වඩාත් සුදුසු වේ.

15. රාබු වගවේ පළිබෝධ පාලනය සඳහා කුරුඳු කුඩු මිශ්‍රණය යෙදීම.

රාබු ජනප්‍රිය එළවළුවක් වන අතර සම්පූර්ණම ශාකයම ආහාරයට ගතහැකි සාර්ථකව වගා කළ හැකි අගනා පෝෂ්‍යදායි කෙටි කලීන එළවළුවකි. මෙම රාබු බෝගය සඳහා රෝග සහ පළිබෝධ හානි ඇතිවන අතර කෙටි කාලීන බෝගයක් බැවින් කෘෂි රසායනික යෙදීම ඉතාම අහිතකරය. එම නිසා රාබු වගාවේ හානි කරන රෝග හා පළිබෝධකයින් මර්ධනය සඳහා 1% කුරුඳු කුඩු ද්‍රාවනය දින පහකට වරක් බැගින් ඉසීමෙන් සාර්ථක ප්‍රතිපළ ලබාගත හැකිය.

16. කොම්පෝස්ට් පොහොර නිපදවා ගැනීම.

සත්ව අපද්‍රව්‍යය සහ ශාක කොටස් දිරාපත්වීමට සැලැස්වීමෙන් කොම්පෝස්ට් පොහොර නිපදවා ගනු ලබයි. මෙහිදී දිරාපත්වීම සිදු වන්නේ ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නිසා බැවින් උෂ්ණත්වය සහ තෙතමනය ක්ෂුද්‍ර ජීවීන්ට සුදුසු පරිදි පවත්වාගෙන යාම වැදගත් වේ.

ඔබට ආකාර 2කට කොම්පෝස්ට් පොහොර නිපදවා ගත හැකිය ;

1. ගොඩ ක්‍රමය
2. කෝටු රාමු ක්‍රමය

<u>කොම්පෝස්ට් පොහොර නිපදවීමට අවශ්‍ය ද්‍රව්‍යය</u>

- සත්ව අපද්‍රව්‍ය : කුකුල් පොහොර, එළු පොහොර, ගොම පොහොර වැනි
- ශාකමය ද්‍රව්‍ය : වියලි ශාක පත්‍ර හා අමු කොළ අතු
- බෝග අවශේෂ : කුඩාවට කපාගත් කෙසෙල්

- කොම්පෝස්ට් මුහුන් හෝ හොදින් දිරාගිය කොලරොඩු
- කොම්පෝස්ට් ගොඩ වසා තැබීමට ප්‍රමාණවත් පොලිතීන් කැබැල්ලක් හා කොහුලණු කැබැල්ලක් ප්‍රමාණවත් පරිදි ජලය

<u>ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් පිලියෙල කිරීම්</u>

- හොදින් බිම සමතලා කර වතුර නොරැදෙන සේ සකස් කර කොම්පෝස්ට් ගොඩෙහි දිග හා පළල සලකුණු කරගන්න.
- ප්‍රථමයෙන් පස මතුපිට අගල් හයක් අටක් පමණ උස වියළි ශාක ද්‍රව්‍ය තට්ටුවක් අතුරා ඒ මත සත්ව පොහොර අගල් 3ක පමණ තට්ටුවක් අතුරන්න.
- ඊට උඩින් අමු කොළ ලපටි අතු අඟල් 6-8 ක තට්ටුවක් අතුරා ඒ මත කොම්පෝස්ට් මුහුන් වර්ග මීටරයට ග්රෑම් 30ක් පමණ පරිදි විසුරුවා හරින්න.

- ඉන්පසු මාරුවෙන් මාරුවට සත්ව අපද්‍රව්‍ය හා ශාක අපද්‍රව්‍ය අඩි පහක් පමණ උසට අතුරන්න. එසේ ඇතිරීමේදී සෑම තට්ටු දෙකක් අතරටම මුහුන් යෙදීම දීම කළ යුතුය.
- සත්ව අපද්‍රව්‍ය නොමැතිනම් වියළි ශාක අප අපද්‍රව්‍ය හා අමු කොළ පොහොර මාරුවෙන් මාරුවට අතුරන්න.
- භාවිතා කරන ද්‍රව්‍ය පමණට වඩා වියළි නම් තට්ටුවක් ඇතිරූ පසු ජලය තෙත් කළ යුතුය.
- භාවිතා කරන යම් ද්‍රව්‍යක් පමණට වඩා තෙත් නම් ගොඩ සෑදීමේදී වියළි උපස්තරයක් මත ඇතිරීමට සැලකිලිමත් වන්න.
- තට්ටු අතුරා අවසන් වූ පසු ගොඩ වටේ පහලින් අඟල් දහයක පමණ ඉඩක් ඉතිරි වන සේ පොලිතීන් කැබැල්ලෙන් වසා ලණුවලින් හොඳින් ගැට ගසන්න.
- සෑම සතියකට වරක් ම තෙතමනය හා උෂ්ණත්වය පරික්ෂා පරීක්ෂා කරන්න.

තෙතමනය ප්‍රමාණවත් නොවේ නම් ජලය යොදා තෙත් කරන්න.

- පලමු සති හතර තුළ අතට දැනෙන තරමේ උෂ්ණත්වයක් ගොඩ තුළ පවත්වා ගත යුතුයි. උෂ්ණත්වය අඩු නම් තෙතමනය පරීක්ෂාකර වතුර යොදන්න.
- සති 4 හතරකට පසු පළමු පෙරලීම සිදු කර නැවත ගොඩ ගසා පෙර පරිදි වසා තැබිය යුතු වන අතර පළමු පෙරළීමෙන් සති හතරකට පසු දෙවන පෙරලීමද දෙවන පෙරළීමෙන් සති හතරකට පසු තුන්වන පෙරලීම ද සිදුකර සෑම පෙරලීමකින්ම පසුව පොලිතීනයෙන් වසා තබන්න.
- තුන්වෙනි පෙරළීමෙන් පසු පොහොර භාවිතය සඳහා සුදුසු වේ.
- තුන්වන පෙරළීමෙන් දිරාපත් වීම ප්‍රමාණවත් නොවේ නම් නැවත ගොඩ සකස් කර හොඳින් තෙත් කර අමතර සති දෙකක් තබන්න.

- මෙම සෑම පෙරලීමකදී මුහුම් සහ ජලය මිශ්‍ර කර ගැනීම මගින් නොදිරන ලද කොටස් කඩිනමින් දිරා පත් කළ හැකිය.
- මේ අනුව මාස 3-3 ½කට පසුව ගුණාත්මක කොම්පෝස්ට් පොහොර ඔබට නිපදවා ගත හැකි අතර අඟල් ½ ක දැලකින් හලා මළුලුවලට අසුරා නොතෙමෙන ස්ථානයක ගබඩා කර තැබීමෙන් අවශ්‍ය අවස්ථාවකදී භාවිතයට ගත හැකිය.

<u>කෝටු රාමු ක්‍රමය</u>

- ග්ලිරිසීඩියා හෝ වෙනත් කොටු වර්ගයක් උපයෝගි කරගෙන කෝටු රාමුවක් සාදා ගන්න.
- ගෙවත්වත්තේ අතුරා ඉවත් කරන කොළ රොඩු අපතේ යන එළවළු සහ මුළුතැන්ගෙයි වෙනත් අපද්‍රව්‍ය ඉදුල් හැර මෙයට එකතු කළ හැකිය.
- නිපදවන කොම්පෝස්ට් වල උනත් ගුණාත්මක බව වැඩි කරගැනීම සඳහා වරින් වර ගොම ගව මුත්‍රා ග්ලිරිසීඩියා අතු යනාදිය එකතු කිරීම සුදුසුය.

- මාස කීපයකට පසුව මෙම කොටුවේ යට පැත්තෙන් දිරණ ලද කොම්පෝස්ට් ලබාගත් හැකිය.
- මෙම ක්‍රමය ගෙවතු වගාවේදී යොදාගත හැකිය.

කෝටු රාමු ක්‍රමය

සුපර් කොම්පෝස්ට් සෑදීම

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- ශාකමය ද්‍රව්‍ය - වියළි කොළ සහ අමු කොළ
- සත්ව පොහොර - ගව ගොම, කුකුළු පොහොර, එළු පොහොර
- බෝග අපද්‍රව්‍ය
- ක්ෂුද්‍රජීවී මුහුම් - ජීවමෘත
- එප්පාවල රොක් පොස්පේට් - ERP
- ෆෙල්ස්පාර් හෝ මාලු ටොනික්
- ජීව අඟුරු
- ජලය
- කොම්පෝස්ට් ගොඩ වැසීමට කළු පොලිතින්
- ලණුවක්

<u>සාදා ගන්නා ආකාරය</u>

- හොඳින් බිම සමතලා කර වතුර නොරැඳෙන සේ සකස් කර කොම්පෝස්ට් ගොඩෙහි දිග හා පළල සලකුණු කරගන්න.

- පළමුව, පස මතුපිටට කිලෝග්රෑම් 50 ක් පමණ වියළි ශාක ද්‍රව්‍ය තට්ටුවක් දමා ඒ මත සත්ව පොහොර කිලෝග්රෑම් 30 ක් පමණ තට්ටුවක් දමන්න.
- ඒ මත අමු කොළ, ළපටි අතු 20kg පමණ ස්ථරයක් දමන්න.
- ඊට උඩින්, අමු ද්‍රව්‍ය කිලෝග්රෑම් 100කට ERP (10%), Feldspar (5%), Bio char (5%) සහ Jewamurthum (10%) විසුරුවා හරින්න.
- ඉන්පසු, මීටර් 1 - 1.5 පමණ උස දක්වා මාරුවෙන් මාරුවට සත්ව හා ශාක පොහොර ස්ථර වශයෙන් යොදන්න.
- ERP, ෆෙල්ස්පාර්, ජීව අඟුරු සහ ජීවමෘත ඉහත සඳහන් ප්‍රතිශත වලින් සෑම ස්ථරයක් අතරම එකතු කළ යුතුය.
- සෑම ස්ථරයක්ම ජලයෙන් තෙත් කළ යුතුය.
- සත්ව අපද්‍රව්‍ය නොමැති නම් වියළි ශාක ද්‍රව්‍ය සහ අමු පත්‍ර මාරුවෙන් මාරුවට යොදන්න.

- භාවිතා කරන යම් ද්‍රව්‍යයක් පමණට වඩා තෙත් නම් ගොඩ සෑදීමේදී වියළි උපස්තරයක් මත ඇතිරීමට සැලකිලිමත් වන්න.
- තට්ටු අතුරා අවසන් වූ පසු ගොඩ වටේ පහළින් අඟල් දහයක පමණ ඉඩක් ඉතිරි වන සේ පොලිතීන් කැබැල්ලෙන් වසා ලණුවලින් හොඳින් ගැට ගසන්න.
- සෑම සතියකට වරක් ම තෙතමනය හා උෂ්ණත්වය පරීක්ෂා කරන්න. තෙතමනය ප්‍රමාණවත් නොවේ නම් ජලය යොදා තෙත් කරන්න.
- පලමු සති 3 තුළ අතට දැනෙන තරමේ උෂ්ණත්වයක් ගොඩ තුළ පවත්වා ගත යුතුයි. උෂ්ණත්වය අඩු නම් තෙතමනය පරීක්ෂාකර වතුර යොදන්න.
- සති 3කට පසු පළමු පෙරලීම සිදු කර නැවත ගොඩ ගසා පෙර පරිදි වසා තැබිය යුතු වන අතර පළමු පෙරළීමෙන් සති 2කට පසු දෙවන පෙරලීමද දෙවන පෙරළීමෙන් සති 2කට පසු තුන්වන

පෙරලීම ද සිදුකර සෑම පෙරලීමකින්ම පසුව පොලිතීනයෙන් වසා තබන්න.

- සෑම පෙරලීමකදීම ජීවමෘත (10%) එකතු කළ යුතුය.
- තුන්වන පෙරලීමෙන් සති දෙකකට පසු, කොම්පෝස්ට් භාවිතය සඳහා සුදුසු වේ.
- මේ අනුව මාස 2 ½ - 3කට පසුව ණා ගුණාත්මක කොම්පෝස්ට් පොහොර ඔබට නිපදවා ගත හැකි අතර අඟල් ½ ක දැලකින් හලා මළුලුවලට අසුරා නොතෙමෙන ස්ථානයක ගබඩා කර තැබීමෙන් අවශ්‍ය අවස්ථාවකදී භාවිතයට ගත හැකිය.

17. වර්මි කොම්පෝස්ට් සෑදීම

සාමාන්‍යයෙන් කොම්පෝස්ට් පොහොර නිපදවනු ලබන්නේ ක්ෂුද්‍ර ජීවීන් ආධාරයෙනි. ක්ෂුද්‍ර ජීවීන් ට අමතරව පසේ ජීවත් වන ගැඩවිල් පණුවන්ගේ ක්‍රියාකාරිත්වය ද යොදාගෙන ශාක හා සත්ව අපද්‍රව්‍ය මගින් ගුණාත්මයෙන් ඉහළ කොම්පෝස්ට්

පොහොර මසෙකින් පමණ නිපදවා ගත හැකිය. මෙසේ නිපදවාගන්නා පොහොර ගැඩවිල් කොම්පෝස්ට් පොහොර (වර්මිකොම්පෝස්ට්) ලෙස හඳුන්වයි.

<u>ගැඩවිලි පණුවන් ගුණනය කර ගැනීම</u>

- ගැඩවිලි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා ගැඩවිලි විශේෂ 5ක් පමණ අපට ප්‍රයෝජනයට ගත හැකිය. ඒ සඳහා වඩාත්ම සුදුසු වන්නේ රතු පැහැති ගැඩවිල් පණුවන් විශේෂයයි.
- ගැඩවිලි පණුවන් විශේෂ සොයා ගැනීමට අපහසු අවස්ථාවලදී පහත ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීමෙන් ඒ සඳහා සුදුසු ගැඩවිලුන් තෝරා ගත හැකිය.
- ගෙවත්තේ ඇති කුණුගොඩක් පාදා එය තෙත් කර ඒ මතට සක්කර (උක් හකුරු) ද්‍රාවණයක පොගවා ගත් තෙත ගෝණියක් දමා ඒ මතට අමු ගොම ස්වල්පයක් දමන්න.

- සතියකින් පමණ බැලූ විට ගෝනියේ යට පැත්තේ රතු පැහැති ගැඩවිලුන් රාශියක් දැකගත හැකි ය. එම සතුන් අමු ගොම සහිත බඳුනකට දමා තබන්න.
- මෙසේ සපයාගත් ගැඩවිලි පණුවන් පහත ක්‍රියාමාර්ග අනුගමනයෙන් ගුණනය කරගත හැකිය.
- ලීටර් 200 ප්ලාස්ටික් බැරල් එකෙන් භාගයක් ගෙන පතුලට ආසන්නයේ ජලය වහනය සඳහා සිදුරු කරන්න. එය හොඳින් සෙවණ සහිත ස්ථානයක තබා එම බඳුන පතුලට අඟල් දෙකක පමණ ප්‍රමාණයේ උළු හෝ ගඩොල් කැබලි අතුරා ඒ මත අඟල් දෙකක් පමණ උසට රළු වැලි අතුරන්න.
- ඊට උඩින් අගල් දෙකක් පමණ උසට අමු ගොම තට්ටුවක් යොදන්න.
- අමු ගොම මතට රතු පැහැති ගැඩවිලි පණුවන් යොදන්න. ඉන් අනතුරුව පිදුරු හෝ වියළි කොළ

හෝ ශාක පත්‍ර තට්ටුවක් දමා ප්‍රමාණවත් තෙතමනය ලබා දෙන්න .

- මසකට පමණ පසු ගැඩවිලි පණුවන් ගුණනය වී ඇති බව දැක ගත හැකිය.

- ගැඩවිලි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ආකාර දෙකකට කළ හැකිය

  ○ ටැංකි ක්‍රමය

  ○ බැරල් ක්‍රමය

➢ <u>ටැංකි ක්‍රමය</u>

- වාණිජ මට්ටමින් ගැඩවිල් කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී මෙම ක්‍රමය ඉතා සුදුසුයි.
- ඒ සඳහා සෙවන සැපයීමට වහලය සහිත ගොඩනැගිලිවලට නැගිලිවලල්ලක් අවශ්‍ය වේ.
- එය තුල ඉදිකරන ටැංකි අඩි හයක් පමණ පළල අඩි තුනක් පමණ උස සහ දිග අඩි දහයක් පමණ හෝ අවශ්‍යතාවය අනුව දිග තෝරාගත හැකියි.

- ටැංකිය හි පතුල් කොන්ක්‍රීට් හෝ සිමෙන්ති යොදා ආස්තරණය කිරීම් අවශ්‍යය.
- ටැංකි පතුලේ එක් පසෙකට කුඩා ආනතියක් සහිතව සකස් කර බෑවුම් සහිත බිත්තියෙහි සිදුරු තබා එම සිදුරුවලින් පිටවන ද්‍රාවණය එකතු කරගත් හැකි අයුරින් සකස් කිරීමෙන් ගැඩවිල් දියර පොහොර ද ලබාගත හැකියි.

<u>ටැංකි තුළ ගැඩවිල් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය</u>

- සකස්කර ගත් ටැංකිවල පතුලටම අඟල් 6ක පමණ ඝනකමට කොළරොඩු තට්ටුවක් අතුරන්න.
- එම කොලරොඩු තට්ටුව මතට තවත් ගොම හා කොළ රොඩු එක් කිරීම සුදුසුය.
- මේ ආකාරයට ටැංකිය පුරවා ඒ මතට පණුවන් සහිත ගොම මිශ්‍රණය ඒකාකාරීව පැතිරෙන ලෙස විසුරුවන්න.

- එම ටැංකි අවශ්‍ය පරිදි තෙත් කර සෙවන හා වාතාශ්‍රය ලබා දෙන්න. ප්‍රශස්ත තෙතමනය පවත්වා ගැනීම ඉතා වැදගත්ය.
- මසකට පමණ පසු යෙදූ කාබනික ද්‍රව්‍ය පණු පොහොර බවට පත්ව තිබෙනු දැකිය හැකිය.

<u>ගැඩවිල් කොම්පෝස්ට් පොහොර වලින් පණුවන් ඉවත් කර ගැනීම</u>

- සාදාගත් පණු පොහොර ටැංකියේ කෙළවරකට ගොඩගසන්න. හිස් වූ කෙළවරට අමු ගොම හා කොළ රොඩු එකතු කරන්න.
- පණු පොහොර ගොඩ වියළීමට හරින්න. හැකිනම් සූර්යාලෝකය වැටීමට සලස්වන්න.
- අමු ගොම හා කොළ රොඩු එකතු කළ පැත්ත අවශ්‍ය පරිදි තෙත්කර සෙවන හා වාතාශ්‍රය ලබා දෙන්න. මෙසේ සතියකට පමණ පසු සාදාගත් පණු පොහොර ගොඩහි සිටි පණුවන් අමු ගොම

හා කොළ රොඩු එකතු කල පැත්තට ගමන් කරයි.

➢ <u>බැරල් ක්‍රමය</u>

- මෙම ක්‍රමය කුඩා පරිමාණයෙන් ගැඩවිල් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර ගැනීම සඳහා යොදා ගත හැකිය.
- මේ සදහා සිමෙන්ති ලෝහ හෝ ප්ලාස්ටික් වලින් සෑදූ භාජනයක් භාවිතා කළ හැකිය.
- භාජනයෙහි උස උපරිම අඩි තුනක් තිබීම ප්‍රමාණවත්ය.
- එහි පතුල හොඳින් සිල් වී තිබිය යුතුය. එම භාජනය පතුලට ආසන්නයෙන් ජලවහනය සඳහා බිත්තිය සිදුරු කරන්න.
- එය හොඳින් සෙවණ සහිත ස්ථානයක තබන්න. සෙවන සැපයීමට වහලය සහිත තාවකාලික මඩුවක් හෝ ඉදිකිරීම කළ යුතුය.

- සකස්කර කරගන්නා ලද භාජනයෙහි පතුලටම අඟල් 6 ක පමණ වියළි කොල රොඩු ස්ථරයක් යොදන්න.
- එම ස්ථරයට ඉහළින් නවත් ගොම හා කාබනික ද්‍රව්‍ය අඩි දෙකක් පමණ පුරවා ගන්න. ඒ මතට ගොම හා සපයා ගන්නා ලද රතු ගැඩවිලි පණුවන් මිශ්‍රණය ඒකාකාරීව විසුරුවා හරින්න.
- එම භාජනයට අවශ්‍ය තෙතමනය, වාතාශ්‍රය හා සෙවන ලබා දෙන්න. මසකට පමණ පසු ගැඩවිලි කොම්පෝස්ට් පොහොර ලබාගත හැකිය. වැඩි තෙතමනය ඉවත් කිරීමට තබන ලද පිටාර සිදුරු මගින් ගැඩවිලි දියර පොහොර ද එකතු කර ගැනීමේ හැකියාව පවතී.

18. ජීවමෘත සකස් කිරීම

ජීව මෘත යනු එළ ගවයන්ගේ ගොම ගව මෘත්‍රා යොදාගනිමින් නිපදවා ගන්නා ක්ෂුද්‍ර ජීවී ද්‍රාවණයකි.

එබැවින් මෙය භාවිතයෙන් පාංශු ක්ෂුද්‍ර ජීවීන් සංඛ්‍යාව හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ඉහළ නංවයි. එය කාබනික දියර පොහොරක් මෙන්ම පාංශු සත්කාරයක් ලෙසද ක්‍රියා කරයි.

<u>ජීව මෘත සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය</u>

1. ලීටර් l200 පමණ ප්ලාස්ටික් බැරලයක්
2. අමු එළ ගව ගොම කිලෝ ග්‍රෑම් 10ක්
3. එළ ගව මෘත්‍රා ලීටර් 10
4. සක්කර හකුරු හෝ දුඹුරු සීනි කිලෝ ග්‍රෑම් 2
5. දෙපියළි බීජ පිටි කිලෝ ග්‍රෑම් 2
6. වනාන්තරයකින් හෝ දිරාපත් වන කොළ ගොඩක් යටින් ලබාග ගත් පස් මිටක්
7. පිරිසිදු ජලය ලීටර් 200 පමණ

<u>සාදාගන්නා පියවර</u>

ඉහත ද්‍රව්‍ය අංක එකේ සිට පහ දක්වා ප්ලාස්ටික් බැරල් එකට දමා ලීටර් දෙසිය මට්ටම දක්වා ජලය

එකතු කර විනාඩි දහයකට පමණ දකුණු අතට කෝටුවකින් කරකවන්න.

මෙසේ දිනකට පස් වරක් දකුණු අතට කෝටුවකින් කරකවා තෙත ගෝනියකින් වසා තබන්න. මේ අන්දමට දින තුනක් මිශ්‍රකර තබා පස් වන දිනට පසු භාවිතයට ගන්න.

<u>භාවිතය</u>

මිශ්‍රණය පෙරා දියර කොටස් 1ට ජලය කොටස් හතරක් මිශ්‍ර කර පත්‍ර තෙමී යන ලෙස වගාව සඳහා ඉසීම කළ යුතුය.

ජීව මෘත වල වෙසෙන ජීවීන් සූර්යාලෝකයෙන් විනාශ වීම වැළැක්වීම සහ ඔවුන්ට අවශ්‍ය ආහාර ලබාදීම සඳහා යෙදීමෙන් පසුව පිදුරු වැනි වසුනක් වැදගත් වේ.

ජීව මෘත කල් තබා ගත නොහැකි බැවින් දින අටකට පෙර භාවිතා කර අවසන් කළ යුතුය.

19. පංචගාව්‍ය සකස් කිරීම

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- අමු ගව ගොම - 17.5kg
- එළගිතෙල් - 2.5kg
- ජලය - 25L
- ගව මූත්‍රා - 25L
- එළ කිරි - 7.5L
- මුදවන ලද එළ කිරි - 5L
- ළපටි පොල් වතුර - 7.5L
- හකුරු 7.5kg
- හොඳින් ඉදුණු කෙසෙල් ගෙඩි 30
- ප්ලාස්ටික් බැරලයක්
- කපු රෙදි කැබැල්ලක්

<u>සාදා ගන්නා ආකාරය</u>

- ගව ගොම (කිලෝ ග්‍රෑම් 17.5) සහ ගිතෙල් (කිලෝග්‍රෑම් 2.5) පළල් කටක් සහිත ප්ලාස්ටික් බැරලයකට, මඩ කළයකට හෝ කොන්ක්‍රීට්

ටැංකියකට එකතු කර දිනකට දෙවරක් ලී කෝටුවකින් කලවම් කරන්න.

- ගෘහ මැස්සන් බිත්තර දැමීම සහ ද්‍රාවණය තුළ පණුවන් ඇතිවීම වැළැක්වීම සඳහා කම්බි දැලකින් හෝ ප්ලාස්ටික් මදුරු දැලකින් ආවරණය කර ද්‍රාවණය දින 3 ක් සෙවන සහිත ස්ථානයක තබන්න.
- ඉන්පසුව, ගව මෘත්‍රා (ලීටර් 25) සහ ජලය (ලීටර් 25) එකතු කර හොඳින් මිශ්‍ර කරන්න.
- එය ආවරණය කිරීමෙන් පසු දින 15 ක් සෙවන ස්ථානයක තැබිය යුතුය.
- සකස් කරන ලද මිශ්‍රණය දිනකට දෙවරක් නිතිපතා කලවම් කල යුතුය.
- දින 15 කට පසු එම ද්‍රාවණයට එළකිරි (ලීටර් 7.5), මුදවන ලද එළකිරි (ලීටර් 5), ළපටි පොල් වතුර (ලීටර් 7.5), හකුරු (කිලෝග්රෑම් 7.5) සහ හොඳින් ඉදුණු කෙසෙල් (30) එකතු කර, සෙවණෙහි තබා දිනකට. දෙවරක් කලවම් කරන්න.

- දින 30 කට පසු පංචගව්යාව මිශ්‍රණය භාවිතයට සුදුසු වේ.
- අවසාන, මිශ්‍රණය ප්ලාස්ටික් බෝතලයක ගබඩා කල හැකිය.

20. ඇකලිපා හිස්පිඩා (බළල් වලිග) පැල නිපදවා ගැනීම.

ඇකලිපා ශාකය අලංකාර විසිතුරු ශාකයක් වන අතර එය ප්‍රචාරණය කර ගැනීම තරමක් අපහසු වේ. එම නිසා වඩාත් පහසු හා සාර්ථක ක්‍රමයක් මෙහිලා සඳහන් කිරීමට අපේක්ෂා කරමු. හොඳින් මේරූ දඬු කැබලි එනම් පොත්ත දුඹුරු පාටින් පවතින සහ දන්ඩෙහි ලීය කොටස හොඳින් මෝරා ඇති දඬු කැබලි මේ සඳහා යොදාගත හැකිය. එසේ නොමැතිනම් ළපටි රිකිලිවල අග්‍රන්ථය දල්ල සහ මේරූ පත්‍ර 2-3 සහිතව කපාගෙන භාවිතා කල හැකිය. මෙහිදී පිරිසිදු ඇල් ජලය බඳුනකට අලුතින් කපන ලද

ආනත කැපුමක් සහිතව ලබාගෙන ජල බදුනෙහි දන්ඩෙහි පතුල නොගෑවෙන පරිදි ගිල්වා රදවන්න. සති 2-3 ක් ගතවන විට හොදින් මුල් ඇද ඇති බව නිරීක්ෂණය කල හැකිය. එසේ නොමැතිනම් කොහුබත් සහ වැලි 1:1 අනුපාතයට මිශ්‍රකරගත් මාධ්‍යයෙන් පිරවූ බදුන් තුල අග්‍රස්ථ කැබලි හෝ දඬු කැබලි සිටුවා ප්‍රොපගේටරයක සති 3 ක් තැබීමෙන්ද පහසුවෙන් මුල් අද්දවාගත හැකිය. මෙසේ මුල් අදින ලද දඬු හෝ රිකිලි ඉතා සාර්ථකව ප්‍රචාරණය සදහා යොදාගත හැකිය.

21. ගෘහාශ්‍රිත විසිතුරු ශාකයක් ලෙස ඇකලිපා (බළල් වලිග) බඳුනක් සකස් කර ගැනීම.

ඇකලිපා හිස්පිඩා නම් වු විද්‍යාත්මක නාමයෙන් හදුන්වන එසේම සාමාන්‍ය ව්‍යවහාරයේදී බළල් වලිග වශයෙන් හදුන්වනු

ලබන ශාකය ඉතා විශාල ලෙස ස්වභාවයේ වැවෙන විසිතුරු ශාකයකි. කෙසේ වුවද එය ගෘහාස්ථ ශාකයක් ලෙස ඒ ආකාරයෙන්ම පවත්වාගත නොහැකිවන බැවින් ප්‍රමාණයෙන් කුඩාවට සකස් කර බදුන්ගත කරගත යුතුව ඇත. ඒ සදහා මුල් අද්දවාගත් දඬු කැබැල්ලක් හෝ අග්‍රස්ථීය කොටසක් (මුල් අද්දවා ගන්නා ආකාරය කලින් දැක්වූ තොරතුරක අඩංගු වේ.) සුදානම් කරගත යුතුය. එමෙන්ම මධ්‍යස්ථ ප්‍රමාණයේ ප්ලාස්ටික්, සිමෙන්ති හෝ ෆයිබර් වලින් නිමකල බදුනක් ගෙන එහි පතුලට තරමක් තද ස්ථරයක් ඇතිවන සේ ගල් කැබලි, ගඩොල් කැබලි හෝ කොන්ක්‍රීට් කැබලි තට්ටුවක් යෙදිය යුතුය. එසේ කිරීමෙන් මුල් ගැඹුරටම ගමන් කිරීම වැලකී ගස් මිටි වීම සිදු වේ. ඒ මතට මතුපිටින් වැලි සහ කාබනික පොහොර 1:1:1 අනුපාතය මිශ්‍ර කර සාදාගත් මිශ්‍රණයක් පුරවා සුදානම් කරගන්න. පසුව මුල් අදිනලද දඬු හෝ අග්‍රස්ථීය කොටස්

ප්‍රවේශමෙන් බදුන මැදින් සිටුවා මදක් ජලය සපයා ගස ස්ථාපනය වන තුරු මද සෙවන ස්ථානයක තබන්න. පසුව දළු දැමීම ආරම්භ වී ගස් වර්ධනය වන විට බදුන මට්ටමින් තමා කැමති උසකට පදුර පවත්වා ගැනීම සඳහා ඉහලට යන අතු කපා වැඩිපුර අතු ඉවත් කර රිසි පරිදි පදුරක් ආකාරයට නඩත්තු කරන්න. කෙටිව වැවෙන පදුරක අලංකාරවත් මල් රාශියක් හටගනු ඇත.

සැකසුම : තාක්ෂණ හා සන්නිවේදන ඒකකය

වැඩිදුර තොරතුරු සඳහා අමතන්න

තාක්ෂණ හා සන්නිවේදන ඒකකය
කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත නව නගරය
හම්බන්තොට

දු.අංකය : 047 2034225